# ඇබෑර්තු

IWWRMP

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

# පරිසර විශේෂඥ (PS3)

## අරමුදල් ප්‍රභවය : ලෝක බැංකුව

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර, එය 2026 ඔක්තෝබර් 31 වෙනි දින වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 01/2019 හා රජයේ බඳවාගැනීමේ ක්‍රියාපටිපාටිය පරිදි "කොන්ත්‍රාත් පදනම" මත පූර්ණකාලීන සේවය සඳහා කොළඹ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පරිසර විශේෂඥ (PS3 කාණ්ඩය) තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද**

**පහත i හෝ ii හෝ iii**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ අවම වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ අවම වසර 8 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

iii. රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 වන පංතියේ නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක් සමග 1 වන පංතියේ තනතුරක අවම වසර 03 ක පළපුරුද්ද.

**සටහන :** ලෝක බැංකුවේ හෝ වෙනත් විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘතිවල, විශේෂයෙන් ප්‍රසම්පාදන, පාරිසරික සහ සමාජීය අංශවල අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද අත්‍යවශ්‍ය වේ.

**වැටුප් මට්ටම** : PS3 කාණ්ඩය රු. 140,000.00 - 155,000.00 (MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි)

**පොදු කොන්දේසි :**

1. අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩුවිය යුතුය.
2. වැටුප් පරිමාණය : රජයේ අනුමත වැටුප් පරිමාණයන් සමග කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) අංක 01/2019 හා 15-03-2019 දනම දරන චක්‍රලේඛය සහ ඉන්පසු සිදුවූ වෙන යම් සංශෝධන පරිදි දීමනා.
3. රැකියා කොන්ත්‍රාත්තුව වසරක් වන අතර කාර්ය සාධනය හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත පදනම්ව වාර්ෂිකව නැවත සේවා කාලය දීර්ඝ කරනු ලැබේ.
4. තෝරාගත් අයදුම්කරු අදාළ රජයේ ආයතන සහ අනෙකුත් නියෝජිතායතන හා සමග සම්බන්ධීකරණයෙන් තම රාජකාරී ඉටු කළ යුතුය.
5. ශ්‍රී ලංකාව තුළ ලෝක බැංකු/ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල වැඩ පළපුරුද්ද අත්‍යවශ්‍යය.
6. ඉංග්‍රීසි භාෂාවේ නිපුණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ මනා දැනුම හා පරිගණක සාක්ෂරතාව, තනතුර සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වේ.
7. අවශ්‍ය අවස්ථාවන්හිදී දිගු වේලාවන් හා සති අන්තයන්හි සේවය කිරීමට ඇති හැකියාව.
8. තම වෘත්තීය ජීවිතය පුරා උසස් නිලධාරීන් සමග යහපත් හැසිරීම හා වෘත්තීය සබඳතා පිළිබඳ සනාථ කළ වාර්තාවක් අවශ්‍යවේ.
9. තරුණ, උද්යෝගිමත් හා කඩිසර අයදුම්කරුවන් අයදුම් කිරීම සඳහා දිරි ගැන්වේ.

තම සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහිත අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කොට 2025 අගෝස්තු 14 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් ඇතුළු රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ දැනට ස්වයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.

ඊට අතිරේකව, අයදුම්පතෙහි පිටපතක්, අයදුම් කරනු ලබන තනතුර ඊ මේල් ශීර්ෂ තීරුවෙහි සඳහන් කරමින් ao.iwwrmp@gmail.com වෙත එවන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයක් මත පදනම්ව සිදු කෙරෙන අතර, කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. කුමන ආකාරයක හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය** (IWWRMP)
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක.96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන : 0112-691163**

**වෙබ් අඩවිය :** www.iwwrmp.lk